කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2021 මාර්තු - 2022 ජනවාරි

මානව ශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය

බෞද්ධ සමාජ චින්තාව - පූද සිරිත් හා උත්සව BUCU E – 2025

ප්‍රශ්න පහකට (5) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාසය පිළිබඳ බෞද්ධ විග්‍රහයේ විශිෂ්ට ලක්ෂණ සහේතුකව පහදන්න.

02. මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය අර්ථවත් කිරීමෙහිලා මානව ශක්‍යතාව උපස්තම්භක වන අයුරු බෞද්ධ සමාජ චින්තාව ඇසුරින් විමර්ශනය කරන්න.

03. සතර බ්‍රහ්මවිහාර සැකෙවින් දක්වා මෛත්‍රීයෙහි පෞද්ගලික හා සමාජ උපයෝගීතාව ප්‍රමාණ කරන්න.

04. සමාජ ප්‍රගතිය හා පරාභවය කෙරෙහි පුද්ගල චර්යාව උපස්තම්භක වන අයුරු මූලාශ්‍රය නයින් පෙන්වා දෙන්න.

05. ධනෝපාර්ජනය හා ධන පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ආධ්‍යාත්මික ශික්ෂණ ප්‍රතිපදාව හා බද්ධවන අයුරු ප්‍රකට කරන්න.

06. දේශපාලන ක්‍රියාවලියේ සාර්ථකත්වය කෙරෙහි අදාළ කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් විමර්ශනය කරන්න.

07. බෞද්ධ සමාජ චින්තාවේ අනන්‍යතාව තහවුරු කිරීමෙහිලා ආගමික සහජීවනය හා සහනශීලීත්වය පිළිබඳ විග්‍රහය උපස්තම්භක වන අයුරු සකාරණව පහදන්න.

08. පිරිතෙහි පරමාර්ථය හා අරමුණු හඳුන්වා දෙමින් එහි සංස්කෘතික මුහුණුවර විභාග කරන්න.

09. ආගමික අරමුණු හා සංස්කෘතික ආකල්ප වඩා වර්ධනයෙහිලා ආරාම කේන්ද්‍රීය පූජෝත්සවයන්හි උපයෝගීතාව කෙතෙක්දැයි විභාග කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.

1 ලක්දිව ගැමි ශාන්ති කර්ම

2 පුණ්‍යානුමෝදනාව

3 සංග්‍රහ වස්තු

4 ත්‍රිවිධ චෛත්‍ය

***********************************